**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ 2010**

-----------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1..2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අවසන් පොත් තොගය ගත් මිල හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ගිණුම් තැබිය යුතු වුවත්, ගත් මිලෙන් 20% ක් සහ 50% ක් වට්ටම් යටතේ අලෙවි කරනු ලබන ළමා ව්‍යාපෘතියේ පොත් තොගය සහ පිරිවැයෙන් 9% වට්ටමකට අලෙවි කරන සංහිතා 1 හා 11 පොත් තොග රු.7,776,495 ක් වූ පිරිවැයට ගිණුම්ගත කර තිබුණි.

1.2.2 නොසසඳන ලද පාලන ගිණුම්

---------------------------------

මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් අදාල උපයෝගී ලේඛන / වාර්තා සමඟ නොසැසඳීම නිසා එම ශේෂ නිවැරදි බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

| ගිණුම් විෂයය | ගිණුම් අනුව ශේෂය | උපයෝගී ලේඛනය / වාර්තාව | උපයෝගී ලේඛනය/ වාර්තාවේ සඳහන් ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | රු. | | රු. | රු. |
| (අ) සංහිතා ව්‍යාපෘතිය II | 64,015 | තොග ලේඛනය | 74,635 | 10,620 |
| (ආ) කැලැව ලස්සනයි ව්‍යාපෘතිය | 133,590 | එම | 132,860 | 730 |
| (ඇ) සිංහල අක්ෂර මාලාව | 20,493 | එම | 20,355 | 138 |
| (ඈ) සංහිතා ව්‍යාපෘතිය I | 70,380 | එම | 70,265 | 115 |

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාහිර පාර්ශවයන් වෙත වර්ෂ 1987 - 1997 අතර කාලය තුළ ලබාදී තිබූ රු.166,005 ක් වූ අත්තිකාරම් ශේෂයන් මේ දක්වා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1986 වර්ෂයටත් පෙර සිට නොවෙනස්ව ඉදිරියට එමින් පවතින ශේෂපත්‍රයේ බැරකම් යටතේ වූ රු.2,876,614 ක හඳුනානොගත් ශේෂ 2 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ලංකා බැංකුවේ රු.200,000 ක් වූ ස්ථාවර තැන්පතුවට අදාළව ලැබිය යුතු පොළී ගිණුමේ ඉකුත් වර්ෂවල සිට ඉදිරියට එමින් පවතින රු.18,711 ක් වූ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සතොසක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) ස්ථාවර තැන්පතුව - රු.250,000 | 250,000 | තැන්පතු සහතිකය |
| (ආ) ස්ථාවර තැන්පතු 4 ක් | 7,479,866 | ශේෂ සනාථ කිරීම් |
| (ඇ) ජර්නල් සටහන් අංක 3, 4 , 6 හා 7 | 135,882 | උපයෝගී ලියවිලි |

### 1.2.5 නීති, රීති හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩල ව්‍යවස්ථාවලිය | |
| (i) 7 ජේදය | අධ්‍යක්ෂවරයාගේ බලය පැවරීමකින් තොරව මණ්ඩලයේ සාමාන්‍ය පරිපාලනය, බැංකු ගිණුම් පාලනය සහ අරමුදල් පාලනය මණ්ඩලයේ ලේකම් විසින් සිදුකර තිබුණි. |
| (ii) 14 ජේදය | මණ්ඩලයේ වැඩ කටයුතු පිළිබඳව සෑම වර්ෂයකදීම මාර්තු 31 දින හෝ ඊට පෙර ඇමතිවරයාට වාර්තා ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9 වගන්තිය | මණ්ඩලය සඳහා සංවිධාන ව්‍යුහයක් සකස් කර ඒ අනුව බලතල බෙදීමක් හා රාජකාරි පැවරීමක් සිදුකර නොතිබූ හෙයින් එක් එක් නිලධාරියාගේ රාජකාරිය නිශ්චිත නොවීය. |

| | |
|---|---|
| (ඇ) 2004 ජූලි 29 දිනැති අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මණ්ඩලයේ අතිරික්ත මුදල් රු.6,608,579 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණද, ඒ සඳහා අමාත්‍යාංශය භාර ඇමතිවරයාගේ හා මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 හා 881 | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තැබිය යුතු නිලධාරීන් තුන්දෙනෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |

2. මණ්ඩලය සංස්ථාපනය කිරීම
-------------------------------

1972 මැයි 17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකා ජාතික පොත් (ග්‍රන්ථ) සංවර්ධන මණ්ඩලයක් පිහිටුවීමටත්, එය පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමටත්, ක්‍රියා විරහිතව පවත්නා ජාතික පොත්පත් සංස්ථාවේ වත්කම් හා සේවක මණ්ඩලය යෝජිත ජාතික පොත් (ග්‍රන්ථ) සංවර්ධන මණ්ඩලයට පැවරීමටත් තීරණය කර තිබුණි. එකී තීරණය ප්‍රකාර ජාතික පොත් (ග්‍රන්ථ) සංවර්ධන මණ්ඩලය ස්ථාපනය කර තිබුණද, ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස එය නීතිගත කර නොතිබුණි. 1974 ජූනි 12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මෙම මණ්ඩලය අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්ගේ විධාන යටතේ පැවැත්වෙන ව්‍යවස්ථාපිත නොවන බල මණ්ඩලයක් ලෙස පවත්වාගෙන යාමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/07/0542/316/022 හා 2007 අප්‍රේල් 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මණ්ඩලය ව්‍යවස්ථාපිත තත්වයට පත් කිරීමට අදාලව අනුමත කරන ලද එහි සඳහන් ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-----------------------------------

3.1 මූල්‍ය සමාලෝචනය
---------------------

මූල්‍ය ප්‍රතිඵල
--------------

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.2,646,830 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව 2009 වර්ෂය සඳහා වූ අතිරික්තය රු.1,981,278 ක් විය. ඒ අනුව 2009 වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.665,552 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

(ආ) පොත් මිලදී ගැනීම, මුද්‍රණය කිරීම හා අලෙවි කිරීම මණ්ඩලයේ ප්‍රධාන මෙහෙයුම් කාර්‍යයක් වුවද, අලෙවි කරන ලද පොත්වල පිරිවැය, අලෙවි ආදායම් සමඟ සසඳා මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් නොකර පොත් ගැණුම් හා විකුණුම් ලෙජර් ගිණුම් අතර අවිධිමත්ව ගැලපීම් කර වාර්ෂික මූල්‍ය ප්‍රතිඵල ගණනය කර තිබුණි.

(ඇ) ගබඩාවේ ඉතිරි පොත් තොග අවිධිමත් ගබඩාකරණය හා ස්වභාවික ආපදාවලට ලක්වීම හේතුවෙන් එහි උපලබ්ධි අගය ඉතා අඩු වුවත්, එයට අදාල ගැලපීම් සිදු නොකිරීම නිසා ආදායම් වියදම් ගිණුමේ සාවද්‍ය අතිරික්තයක් නිරූපණය වේ.

3.2 මෙහෙයුම් සමාලෝචනය
--------------------------

3.2.1 කාර්ය සාධනය
-------------------

(අ) 2007 ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩල ව්‍යවස්ථාවලියේ 03 ජේදයේ සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත සාමාජික මණ්ඩලයක් සිටිය යුතු වුවත්, 2010 මැයි මස 12 වන දින තෙක් පැවති සාමාජික මණ්ඩලය ඉල්ලා අස්වීමෙන් පසු මේ දක්වා නව සාමාජික මණ්ඩලයක් පත් නොකර 2011 පෙබරවාර 28 දින සභාපතිවරයෙක් පත්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මෙහි මුළු ඇස්තමේන්තු ගත වටිනාකමින් 50% ක් වන රු.4,665,000ක් වැඩසටහන් 13ක් සඳහා වෙන්කර තිබුණද,එම ප්‍රතිපාදන වලින් කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

3.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ලේඛකාධාර ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,194,550 ක් වටිනා පොත් 6,792 ක් මිලදී ගෙන තිබූ නමුත් එම මිලදී ගැනීමේදී, මණ්ඩලය විසින් හඳුන්වා දී තිබූ නිර්ණායකයන්ට අනුකූල බවට සමීක්ෂණයක් කර නොතිබූ අතර ව්‍යාපෘතිය පිළිබඳව කතුවරුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ලේඛකාධාර ව්‍යාපෘතිය යටතේ මිලදී ගනු ලබන සියළු පොත් දිළිඳු පාසැල් පුස්තකාල සංවර්ධනය කිරීමේ අරමුණෙන් පරිත්‍යාග කිරීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වුවද, ඉන් බැහැරව පාසැල්, දහම් පාසැල් හා මහජන පුස්තකාල ආදියේ ඉල්ලීම් මත පරිත්‍යාගයන් සිදු කර තිබුණි.

(ඇ) පොත් තොග

--------------

(i) පොත් අලෙවි කිරීම හා පරිත්‍යාග කිරීම පිළිබඳ නිසි වැඩපිළිවෙලක් නොමැතිව පොත් මිලදී ගැනීම හේතුවෙන් වාර්ෂිකව තොග මට්ටම් අඛණ්ඩව ඉහළ යමින් තිබුණි.

| වර්ෂය | අවසාන ඉතිරි තොගය |
|---|---|
| -------- | ------------------------ |
| | රු. |
| 2010 | 12,344,516 |
| 2009 | 11,498,162 |
| 2008 | 11,268,802 |
| 2007 | 9,738,106 |
| 2006 | 7,880,758 |

(ii) අවිධිමත් ගබඩාකරණය හේතුවෙන් පොත් විශාල ප්‍රමාණයක් ස්වභාවික උවදුරු හා කෘමි උවදුරුවලට ලක් වීමෙන් විනාශ වී තිබුණි.

(iii) මු.රෙ. 756 ප්‍රකාරව පොත් සම්බන්ධ භාණ්ඩ සමීක්ෂණයක් ආරම්භයේ සිට මේ දක්වාම සිදු කර නොතිබුණි.

(iv) මු.රෙ. 752 හා 753 පරිදි භාණ්ඩ ලැබීම්පත් හා නිකුත් කිරීම්පත් භාවිතා කිරීමත්, මු.රෙ. 751 හා 754 පරිදි ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි තොග පොත්වල සටහන් කිරීමත්, තොග පොත් තුලනය කිරීමත් සිදු කොට නොතිබුණි.

3.2.3 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

2010 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.2,050,276 ක් වී තිබුණද, මණ්ඩලයේ සාමාන්‍ය මාසික මූල්‍ය අවශ්‍යතාවය රු.500,000 බව බැංකු ගිණුම් පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර එම අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර ආදායමක් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

3.2.4 සංයුක්ත සැලැස්ම

--------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ආයතන යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව මණ්ඩලය විසින් සංයුක්ත සැලැසමක් පිළියෙල කර නොතිබුණි.

3.2.5 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2003 ජූනි 30 දිනැති අංක පීඊඩී/12 චක්‍රලේඛයෙහි 7.4.1 හා 7.4.2 වගන්ති සහ 2005 ජූලි 01 දිනැති අංක පීඊඩී/31 දරන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

3.2.6 අභ්‍යන්තර විගණනය

----------------------

අදාල රේඛීය අමාත්‍යාංශයේ සහය ඇතිව හෝ අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

3.2.7 අයවැය ලේඛනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මණ්ඩලයේ අයවැය ලේඛනය අංක පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ආයතන යහපාලනය පිළිබඳ මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 5.2 වගන්තියට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

(ආ) අයවැය ලේඛනයේ අයවැයගත හා සත්‍ය වියදම් අතර විචලතාවය 20% සිට 100% ක් දක්වාද,අයවැයගත ආදායම 24% කින් සත්‍ය ආදායමට ළඟා වීමට නොහැකි වීමෙන්ද පෙනී යන්නේ අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බවයි.

4. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය හා බලතල බෙදීම

(ඇ) තොග පාලනය

(ඈ) කාර්ය සාධනය

(ඉ) සැලසුම්කරණය හා අයවැය පාලනය

(ඊ) පොත් මිළදී ගැනීම හා අලෙවිය